**ශීර්ෂය 147 - ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

---

ශීර්ෂය 147 - ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 සැප්තැම්බර් 17 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

-------

**2.1 විසර්ජන ගිණුම**

----------------

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---------------------------

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 634.43 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 540.60 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 93.83 ක් හෙවත් සියයට 14.79 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 469.93 | 421.16 | 48.77 | 10.38 |
| මූලධන | 164.50 | 119.44 | 45.06 | 27.39 |
| **එකතුව** | **634.43** | **540.60** | **93.83** | **14.79** |

**2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාළ විෂය අංක 14701 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 2.00 | 0.66 | 0.15 | 0.35 | 3.50 | 2.00 |

**2.3 විගණන නිරීක්ෂණය**

ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර වැය ලෙජරය විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | **ලේඛන වර්ගය** | **අදාළ රෙගුලාසිය** | **නිරීක්ෂණය** |
|---|---|---|---|
| (i) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා නොතිබුණි. |
| (ii) | පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි /2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (iii) | දෙපාර්තමේන්තු විසර්ජන(සම්මත) ලෙජරය | මුදල් රෙගුලාසි 447 | යාවත්කාලින කර නොතිබුණි. |

**3.2 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**අභ්‍යන්තර විගණනය**

මුදල් රෙගුලාසි 134(1) ප්‍රකාරව මූල්‍ය හා කාර්යසාධන කටයුතු විධිමත් පරිදි ඉටු කර ගැනීම සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් අමාත්‍යාංශයේ ස්ථාපිත කර නොතිබුණි.

**3.3 වත්කම් කළමනාකරණය**

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2016 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2017 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, අමාත්‍යාංශය විසින් එම වාර්තා ප්‍රමාද කර 2017 ඔක්තෝබර් 10 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

**3.4 කාර්යසාධනය**

අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන් අතර පහත සඳහන් කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් සකස්කර තිබුණද , එකී කාර්යයන් සම්පූර්ණ වශයෙන් ඉටුකර නොතිබුණි.

| | කාර්යයන් | සලසා තිබුණු ප්‍රතිපාදනය රු.මිලියන | 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රගතිය රු.මිලියන | නිරීක්ෂණය |
|---|---|---|---|---|
| (i) | ප්‍රාදේශීය සංවර්ධනය, ජාතික කෘෂිකාර්මික විවිධාංගීකරණය හා ජනාවාස අධිකාරිය (හදබිම) යන ආයතනයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම. | 66.0 | 89.58 | සලසා තිබුණු ප්‍රතිපාදනය ඉක්මවා රු.මිලියන 23.58 ක් වැයකර තිබුණද, අදාළ කාර්යභාරය සම්පූර්ණයෙන් ඉටු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | ප්‍රාදේශීය කර්මාන්ත ප්‍රවර්ධනය ඇතුළුව ප්‍රාදේශීය ආර්ථික ශක්තිමත් කිරීම සඳහා සුදුසු ආර්ථික හා සමාජ සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘතීන් සම්බන්ධීකරණය කිරීම. | 1.20 | 0.10 | ක්‍රියාකාරකම් 06 කින් ක්‍රියාකාරකම් 05 ක අපේක්ෂිත ඉලක්කයන් සියයට 40 ක සිට සියයට 50 ක පරාසයක ප්‍රමාණවලින් ඉටු කර තිබුණි. |
| (iii) | නුවරඑළිය, නුවර, මාතලේ, බදුල්ල, ත්‍රිකුණාමලය, මඩකලපුව, අම්පාර, අනුරාධපුරය හා පොළොන්නරුව දිස්ත්‍රික්කවල විශේෂ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම | 0.80 | 0.06 | රු.මිලියන 0.08 ක ප්‍රතිපාදන සලසා තිබුණද ඉන් රු.මිලියන 0.06 ක් පමණක් උපයෝජනය කිරිම සඳහා ක්‍රියාකාරකම් සැලසුම් කර තිබුණි. එකී ක්‍රියාකාරකම් ඉටුකිරීමේ ප්‍රගතිය සියයට 10 ක සිට සියයට 80 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. |

## 3.5 කළමනාකරණ දුර්වලතා

**--------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) අමාත්‍යාංශය විසින් කාර්යාල පරිශ්‍රය සඳහා පෞද්ගලික ආයතනයකින් වර්ග අඩි 49,556 ක ගොඩනැගිල්ල මාසික බදු කුලී පදනම මත වර්ග අඩියක් රු.160 ක් බැගින් රු.මිලියන 10.69 කට ලබා ගෙන තිබුණි. රජයේ තක්සේරුකරු විසින් වර්ග අඩියකට රු.121 බැගින් තක්සේරු කර තිබුණද, එකී තක්සේරුව ඉක්මවා මාසයකට වර්ග අඩියකට රු.39 ක් බැගින් රු.මිලියන 1.93 ක් වැඩිපුර පෞද්ගලික ආයතනයකට ගෙවා තිබුණි.
බදුකුලිය ගත් ගොඩනැගිල්ලේ වූ වර්ග අඩි ප්‍රමාණය ඉක්මවා වර්ග අඩියකට රු.30 ක් බැගින් වර්ග අඩි 9,452 ක් සඳහා සේවා ගාස්තු වශයෙන් රු.283,560 ක් මාසිකව වැඩිපුර ගෙවා තිබුණි. මුදල් රෙගුලාසි 835(2) (ඉ) ප්‍රකාරව බදු කාල සීමාව වර්ෂ 03 කට වැඩි නොවිය යුතු වුවද, එයට පටහැනිව වර්ෂ 05 ක් සඳහා බදු කුලී ගිවිසුමකට එළඹ තිබුණි. ඒ සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන තිබුණි.

(ආ) අමාත්‍යාංශයේ කාර්යාල ගොඩනැගිල්ලෙහි කාමර වෙන්කිරීමේ කොන්ත්‍රාත්තුව ගිවිසුමකින් තොරව ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත ප්‍රදානය කර තිබුණි. ඒ සඳහා බිල්පත් දෙකක් මත රු.මිලියන 31.15 ක් ගෙවා තිබුණි. ඒ සඳහා රඳවාගැනීම් අඩුකර ගෙන නොතිබුණි.

## 3.6 මානව සම්පත් කළමනාකරණය

-------------------------------------

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

-----------------------------------------------------

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 08 | 04 | 04 |
| (ii) | තෘතියික මට්ටම | 07 | 03 | 04 |
| (iii) | ද්විතියික මට්ටම | 42 | 09 | 33 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 22 | 13 | 09 |
| (v) | වෙනත්- කොන්ත්‍රාත් | 66 | - | 66 |
| | - තාවකාලික | 06 | 02 | 04 |
| | **එකතුව** | **151** | **31** | **120** |